කොවිඩ්-19 සම්බන්ධ වාර්තාකරණයේදී මාධ්‍ය මගින් භාවිතා කරනා භාෂාවද වැදගත් වන්නේ, කොවිඩ්-19 ආසාදිතයින් කොන් කෙරෙනා ආකල්පයක්, ඔවුන් කෙරෙහි සමාජ ගර්හාවක් ඇති ඇති නොකිරීම උදෙසායි. මන්දයත්, කොවිඩ්-19 ආසාදිතයින් කෙරෙහි එවැනි කොන් කිරීමක් හෝ සමාජ ගර්හාවක් ඇතිවූ විට, ආසාදිතයින් වෛද්‍ය ප්‍රතිකාර නොගෙන සැඟවීමට උත්සාහ දැරීමත්, ඒ ඔස්සේ කොවිඩ්-19 පාලනය තවත් අපහසු වීමත් සිදුවිය හැකි බැවිනි.

මෙසේ බලන කළ, "කොවිඩ් ගැබිනි කතුන්", "කොරෝනා රැඳවියන්" වැනි යෙදුම් ශිෂ්ට චින්තනයක් සමාජය තුළ නෂ්ට කිරීම සඳහා දායක වනු ඇතිද, කෙතරම් පුද්ගල ගරුත්වය කෙළෙසන සුළුද කියා සිතා බැලීමට සිදුවනු ඇත. පුවත් වාර්තාවන්හි සිරස්තල යෙදීමේදී අඩු වචන ප්‍රමාණයකි අදහසක් ලබාදීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් විවාදයක් නොමැත. එනමුත්, එම අවශ්‍යතාවය සඳහා මෙවැනි යෙදුම් භාවිතා කිරීම සාධාරණීකරණය කළ හැකිද? මෙවන් යෙදුම් ශිෂ්ට සම්පන්න යැයි ඔබ සිතන්නේද?

#Covid19 #MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Aruna